# 2023 අයවැය ලේඛනය
# வரவு செலவு திட்டம்
# ANNUAL BUDGET






## කුරුවිට ප්‍රාදේශීය සභාව
## குருவிட்ட பிரதேச சபை
## KURUWITA PRADESHIYA SABHA

# අන්තර්ගතය


1. සම්මුතිය
2. දැක්ම හා මෙහෙවර ප්‍රකාශය
3. කුරුවිට ප්‍රාදේශීය සභාවේ අරමුණ
4. කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශය
5. බලප්‍රදේශයේ සිතියම.
6. කුරුවිට ප්‍රාදේශීය සභාවේ සංස්ථාපනය
7. කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය
8. කුරුවිට ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියගේ පණිවිඩය
9. කුරුවිට ප්‍රාදේශීය සභාවේ පොදු තොරතුරු
10. මිනිස් බල සාරාංශය
11. කාර්යය මණ්ඩල සංවිධාන සටහන
12. 2023 වර්ෂය සඳහා අය වැය සාරාංශය
13. 2023-2022 වර්ෂය සඳහා ආදායම් සාරාංශය
14. ඇස්තමේන්තුගත 2023 -2022 වර්ෂය සඳහා ආදායම් ස්ථම්බ ප්‍රස්ථාර මඟින්
15. 2023 -2022 වර්ෂය සඳහා වියදම් සාරාංශය
16. ඇස්තමේන්තුගත 2023-2022 වර්ෂ සඳහා වියදම් ස්ථම්බ ප්‍රස්ථාර මඟින්
17. කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2023 – 2022 වර්ෂ වල ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව
18. 2023 වර්ෂයේ ආදායම්, වියදම් ඇස්තමේන්තුව

# දැක්ම

පළාත් පාලනයේ විශිෂ්ටයා වීම.

# මෙහෙවර ප්‍රකාශය

කුරුවිට හා කිරිඇල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ස්ථාපනය කරන ලද කුරුවිට ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යයට, පොදු උපයෝගීතා සේවාවන්ට සහ පොදු මංමාවත්වලටද, සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභ සාධනය යන සියලු පහසුකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමටද, අදාළ සියලු කරුණු විධිමත් කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ප්‍රමුඛ මෙහෙවරයන් වන්නේය.

# කුරුවිට ප්‍රාදේශීය සභාවේ අරමුණ

පරිපාලන හා සංවර්ධන කාර්යයන් සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලියට ජනතා සහයෝගය ඵලදායී ලෙස ලබා ගැනීම හා සේවාවන් ලබා ගැනීමට සහ ගැටළු විසදා ගැනීමට ප්‍රාදේශීය සභාවට පැමිණෙන සියලුම දෙනා වෙත කාර්යක්ෂම සහ සුහද සේවාවක් ලබා දීම අප සභාවේ අරමුණ වේ.

# **2023 වර්ෂයේ වැඩසටහන් අයවැය ලේඛනය**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය විසින්, පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 06 වන කොටසේ 168 වන වගන්ති ප්‍රකාර එහි නියමයන්ට හා නියෝගයන්ට අනුකූලව පිළියල කරන ලද, 2023 වර්ෂයේ වැඩසටහන් අයවැය ලේඛනය වර්ෂ 2022 නොවැම්බර් මස 14 වන දින සභා තීරණ අංක 05-05 යටතේ කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභාවට ඉදිරිපත් කර සම්මත කරන ලදී.**

**ප්‍රේමරත්න මල්කැකුල,**
**සභාපති,**
**ප්‍රාදේශීය සභව,**
**කුරුවිට.**

# බල ප්‍රදේශය හැඳින්වීම

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඊසාන දෙසින් සමනල කඳු වැටිය සහිත නුවරඑළිය දිස්ත්‍රික්කයෙන්ද,නිරිත දිගින් අයගම ප්‍රාදේශීය සභාවටත්, නැගෙනහිර දෙසින් රත්නපුර ප්‍රාදේශීය සභාවටත් හා උතුරු දෙසින් ඇහැලිගොඩ ප්‍රාදේශිය සභාවටත් මායිම්ව පිහිටා ඇත.

ප්‍රධාන පරිපාලන දිස්ත්‍රික්කය රත්නපුර වන අතර මැතිවරණ කොට්ඨාශ වනුයේ ඇහැලියගොඩ හා රත්නපුර නගරය. කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශය කුරුවිට හා කිරිඇල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකකින්ද, ග්‍රාම නිලධාරී වසම් 56කින් හා ප්‍රාදේශිය සභා උප කාර්යාල 03 කින්ද සමන්විත වූ මෙම බලප්‍රදේශය වර්ග කීලෝමීටර් 263.10 ක විශාලත්වයකින් යුක්ත වේ.

බහු වාර්ගික හා බහු ආගමික ජන සමාජයකින් යුක්ත වූ මෙහි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මැණික් කර්මාන්තය හා කෘෂි කර්මාන්තය වන අතර මෙම ප්‍රදේශය බටහිරට විහිදි යන පහත්බිම් අඩි 500 සමෝච්ඡ රේඛාව තුළ ඇති අතර කුරුවිට නගරයේ සිට සමනළ කඳුවැටිය දක්වා විහිදෙන කඳු මුදුන් අඩි 1000 සිට 5000 දක්වා උසකින්ද යුක්ත වේ. මෙම ප්‍රදේශයට වාර්ෂිකව මි.මී.2500 සිට 3500 දක්වා පමණ වාර්ෂික වර්ෂාපතනයක් ලැබේ.

කුරුවිට නගරය මැදින් ගලා යන කුරු ගඟත් බල ප්‍රදේශයට මායිම්ව නිරිත දෙසින් ගලා බසින කලු ගඟත් යන ප්‍රධාන ගංගා දෙකේ බලපෑම හේතුවෙන් නිරන්තර ජල ගැලීම් වලට ගොදුරු වුවත් සියලු සම්පත් වලින් ආඪ්‍ය වූ ස්වාභාවික සම්පතක් වන බෝපත් ඇල්ල ඇතුළු ප්‍රධාන දිය ඇලි හා ,දෙල්ගමු රජමහා විහාරය,නැඳුන් රජ මහා විහාරය, ඓතිහාසික බටදොඹ ලෙන සහ දිවාගුහාව යන පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත වූ ස්ථානවලින්ද යුක්ත ඉතා මනරම් සුන්දර ප්‍රදේශයකි.

# GN DIVISION & ROAD NETWORK
# KURUVITA PRADESHIYA SABHA

| GND CODE | GND NAME |
|---|---|
| | **Kiriella** |
| 147B | Deheragoda |
| 147 | Ellawala |
| 147A | Ellawala Pahalagama |
| 147C | Kanuggalla |
| 149 | Mudunkotuwa |
| 149B | Akurana |
| 145C | Munasinghepura |
| 145 | Kiriella |
| 145D | Handukanda |
| 149A | Matuwagala |
| 144 | Yatipawwa |
| 145A | Epitawala |
| 144A | Ellagawa |
| 150A | Dodampe West |
| 145B | Idangoda |
| 150 | Dodampe |
| 150B | Holeepitaya |
| | **Kuruwita** |
| 146A | Amuhenkanda |
| 127 | Pathberiya |
| 161 | Erathna |
| 127B | Pathberiya West |
| 160 | Endiriyanwala |
| 160A | Devipahala |
| 161B | Adavikanda |
| 161C | Lassakanda |
| 161A | Sudagala |
| 146 | Thalavitiya |
| 127C | Meneripitiya |
| 146B | Bodhimaluwa |
| 127A | Parakaduwa |
| 158 | Pussella |
| 148 | Pohorabawa |
| 159D | Kiragala |
| 159B | Ekneligoda North |
| 158A | Millavitiya |
| 148A | Miyanadeniya |
| 157 | Kandangoda |
| 159 | Wathuyaya |
| 159A | Udakada |
| 156C | Ovitigama |
| 157A | Kandangoda South |
| 155B | Delgamuwa |
| 159C | Ekneligoda |
| 155C | Pahala Kuruvita |
| 156A | Theppanawa Ihalagama |
| 154 | Walandura |
| 155 | Kuruvita |
| 156 | Theppanawa |
| 155D | Pathagama |
| 154B | Nadukaradeniya |
| 156B | Theppanawa Pahalagama |
| 154A | Kahengama |
| 155A | Kithulpe |
| 154E | Kosgoda |
| 154D | Kahengama West |
| 154C | Galukagama |



## Legend

- Main Road (RDA)
- Minor Road (PC)
- PS Road
- PS Boundary
- GN Boundary

| POINT | NAME |
|---|---|
| AC | Army Camp (Gamunu Regiment) |
| AGA | Divisional Secretariat |
| ASC | Agrarian Service Centre |
| BT | Buddhist Temple |
| CB | Cemetry Building |
| CB | Cemetry Building |
| CB | Cemetry Building |
| CB | Circuit Bungalow |
| CC | Cultural Centre |
| CH | Church |
| CO-OP | Co-Operative Shop |
| D | Dispensary |
| DRO | District Registrar's Office |
| EDC | Educational Development Centre |
| FC | Factory |
| GSC | Govijana Service Centre |
| H | Hospital |
| HT | Hindu Temple |
| M | Mosque |
| PB | People's Bank |
| PO | Post Office |
| POS | Police Station |
| PS | Pradeshiya Sabha |
| PSSO | Pradeshiya Sabha - Ellawala Sub Office |
| RBVT | Rural Bank & Vocational Traini |
| RC | Royal Ceramics |
| S | School |
| SB | Samurdi Bank |
| SO | Sanasa Office |
| SPO | Sub Post Office |
| ST | Sri Lanka Telecom |
| TSC | Textile Services Centre |
| VTC | Vocational Training Centre |
| RB | Rural Bank |

0 0.5 1 2 3 4 km

Sri Lanka Institute of Local Governance

# කුරුවිට ප්‍රාදේශීය සභාව සංස්ථාපනය.

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 1988.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 1987.05.12 වන දින අංක 453/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නියමයක් කරමින් ගරු පළාත් පාලන අමාත්‍යතුමන් විසින් කුරුවිට උප දිසාපති කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 56 නියෝජනය කිරීම සඳහා මන්ත්‍රීවරුන් 45 කින් සමන්විත කුරුවිට ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලදී".

| අනු අංකය | තනතුර | නම | නියෝජනය කරන දේශපාලන පක්ෂය | ස්ත්‍රී/ පුරුෂ | පෞද්ගලික ලිපිනය | දුරකතන අංකය |
|---|---|---|---|---|---|---|
| 1 | ගරු සභාපති | එම්.ප්‍රේමරත්න මල්කැකුළ මහතා | ශ්‍රී.ල.පො.පෙ. | පුරුෂ | මෙනේරිපිටිය,පරකඩුව | 0716070700 |
| 2 | ගරු උප සභාපති | අනිල් ජගත් කුමාර ලියනගේ මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | පුවක්ගහදෙනිය, එල්ලාවල | 0717993973 0362258797 |
| 3 | ගරු මන්ත්‍රී | අයි. මංගල කිත්සිරි ඩයස් මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | අනෝමා , මලව,කුරුවිට. | 0755562975 |
| 4 | ගරු මන්ත්‍රී | ජී.එම්.ජයරත්න මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | සීවලිවත්ත,දොඩම්පේ,රත්නපුර | 0716421118 |
| 5 | ගරු මන්ත්‍රී | ආර්.සෝමරත්න මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | වෙදගෙදර,කුරුවිට. | 0718171229 0452263027 |
| 6 | ගරු මන්ත්‍රී | පි.ඩබ්.එස්. සම්පත් බොතේජු මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | වටප්පිටිය,පරකඩුව | 0713201846 |
| 7 | ගරු මන්ත්‍රී | කේ. ඒ. අසංක දිල්ෂාන් මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | නො.41,දෙල්ගමුව, කුරුවිට. | 0713074861 |
| 8 | ගරු මන්ත්‍රී | ඩබ්.එම්.ආර්. ඒ. පතිරණ මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | බටුහේනවත්ත,හිදැල්ලන,රත්න පුර | 0714614253 |
| 9 | ගරු මන්ත්‍රී | එස්.රත්නසිරි මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | පහල කුරුවිට, කුරුවිට. | 0729917266 |
| 10 | ගරු මන්ත්‍රී | පී. දීප්ති චන්දන විජේසිරි මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | ගෝනපිටිය, කුරුවිට. | 0773225556 |
| 11 | ගරු මන්ත්‍රී | බී.ඒ.එස්.පී.කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | බොරළුව, එරත්න. | 0779893009 |
| 12 | ගරු මන්ත්‍රී | පී.තරංග නිල්මිණි ආනන්ද මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | තලාවිටිය,පරකඩුව. | 0774112339 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | ගරු මන්ත්‍රී | බී.ජී ජීවන් අබේවික්‍රමපාල මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | නාමල්දෙණිය පරකඩුව | 0715817961 |
| 14 | ගරු මන්ත්‍රී | ජී.ඒ. ප්‍රේමවතී මහත්මිය | ශ්‍රී.ල.පො.පෙ | ස්ත්‍රී | කීරගලවත්ත, කුරුවිට. | 0773350961 |
| 15 | ගරු මන්ත්‍රී | කේ.කේ. දයාවතී මහත්මිය | ශ්‍රී.ල.පො.පෙ | ස්ත්‍රී | හිග්ගස්හේන, කුරුවිට. | 0777869165 |
| 16 | ගරු මන්ත්‍රී | එස්.ඒ. මහින්ද විජේකුමාර මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | උ/එක්නැලිගොඩ, කන්ද උඩ, කුරුවිට. | 0779966028 |
| 17 | ගරු මන්ත්‍රී | ආර්. ඩිලාන් දර්ශන රණසිංහ මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | මිල්ලවිටිය, කුරුවිට. | 0713360536 |
| 18 | ගරු මන්ත්‍රී | එම්.ජී.ආර්. ධනංජය වීරසේකර මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | පොහොර බාව, පරකඩුව | 0775931196 |
| 19 | ගරු මන්ත්‍රී | ඩබ්.එම්.මධුෂාණි මහත්මිය | ශ්‍රී.ල.පො.පෙ | ස්ත්‍රී | පරණගම, එල්ලාවල. | 0779555012 |
| 20 | ගරු මන්ත්‍රී | එම් මාලනි පීරිස් මහත්මිය | ශ්‍රී.ල.පො.පෙ | ස්ත්‍රී | මාටුවාගල, කිරිඇල්ල. | 0710613987 |
| 21 | ගරු මන්ත්‍රී | ජී.ඩබ්. ජනක විමලසිරි මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | කිතුල්පේ,කුරුවිට. | 0710887135 |
| 22 | ගරු මන්ත්‍රී | ඩී.එම්. ශානක දර්ෂන චතුරංග මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | ගොරකඇල, දොඩම්පේ. | 0712992921 |
| 23 | ගරු මන්ත්‍රී | එස්.එච්.අසංක එරන්ද මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | ඉඩංගොඩ,කිරිඇල්ල | 0713148141 |
| 24 | ගරු මන්ත්‍රී | ඩී. රවීන් විනෝද් මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | 524/2 මුණසිංහ පුර, කිරිඇල්ල | 0714004704 |
| 25 | ගරු මන්ත්‍රී | පී.කේ. ලක්මාල් රුවන් කුමාර මහතා | ශ්‍රී.ල.පො.පෙ | පුරුෂ | විතානකරදගම, යටිපච්ච, කරඳන | 0715181412 |
| 26 | ගරු මන්ත්‍රී | එම්.ඒ. දේවින්ද කුමාර් මහතා | එ.ජා.ප. | පුරුෂ | මුත්තෙට්ටුව හිඳැල්ලන | 0710971322 |
| 27 | ගරු මන්ත්‍රී | අයි.කේ. කුලරත්න මහතා | එ.ජා.ප. | පුරුෂ | පිය සෙවන, කුරුවිට | 0719286802 |
| 28 | ගරු මන්ත්‍රී | එම්.කේ. විජේසිරි මහතා | එ.ජා.ප. | පුරුෂ | පොහොරබාව, පරකඩුව | 0773757490 |
| 29 | ගරු මන්ත්‍රී | එච්.කේ.එම්. එස්.එස්.ධනවර්ධන මහතා | එ.ජා.ප. | පුරුෂ | කිරිඇල්ල | 0712674573 |
| 30 | ගරු මන්ත්‍රී | එච්. විමල්සිරි ජයලත් මහතා | එ.ජා.ප. | පුරුෂ | තිරිවාන, පරකඩුව. | 0713062100 |
| 31 | ගරු මන්ත්‍රී | අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා | එ.ජා.ප. | පුරුෂ | 497/ඒ, තුන්අදහේන,දොඩම්පේ. | 0755557436 |
| | | | | | | |
| | | | | | | |
| | ගරු මන්ත්‍රී | කේ.එල් මානෙල් දර්ශණී කරඳන මහත්මිය | එ.ජා.ප. | ස්ත්‍රී | මිල්ලවිටිය,කුරුවිට. | 0767602980 |
| 33 | ගරු මන්ත්‍රී | එල්.කේ.ජී. යසසිරි ප්‍රභාත් ජයසූරිය මහතා | එ.ජා.ප. | පුරුෂ | තෙප්පනාව , කුරුවිට. | 0719335181 |
| 34 | ගරු මන්ත්‍රී | ඩබ්. චන්ද්‍රලතා මහත්මිය | එ.ජා.ප. | ස්ත්‍රී | නව ජනපදය, පැරඩයිස්, කුරුවිට | 0776266838 |
| 35 | ගරු මන්ත්‍රී | ඩබ්.එම්.ඉන්ද්‍රානි වික්‍රමසිංහ මහත්මිය | එ.ජා.ප. | ස්ත්‍රී | පහල කුරුවිට, කුරුවිට | 0724179546 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 36 | ගරු මන්ත්‍රී | ඒ.නයනා ජීවනි අතුකොරල මහත්මිය | එ.ජා.ප. | ස්ත්‍රී | 472/ ඊ 15,මලව,කුරුවිට. | 0711313032 |
| 37 | ගරු මන්ත්‍රී | බී.ආර්.ඒ. මුදිතා ශ්‍රීමති සෝමරත්න මහත්මිය | එ.ජා.ප. | ස්ත්‍රී | 133/ ඒ, දෙහෙරගොඩ, එල්ලාවල | 0710150108 |
| 38 | ගරු මන්ත්‍රී | ජී.ඊ.ආර්.රනිල් එදිරිසිංහ මහතා | එ.ජා.ප. | පුරුෂ | සමන් පෙදෙස, අඩවිකන්ද | 0765500106 |
| 39 | ගරු මන්ත්‍රී | එම්.පී.ආර්. මදුසංඛ දේශප්‍රිය මහතා | එ.ජ.නි.ස. | පුරුෂ | මෙනේරිපිටිය පරකඩුව | 0715549540 |
| 40 | ගරු මන්ත්‍රී | ඒ.පී චන්දිම යුරේෂ් පතිරණ මහතා | එ.ජ.නි.ස. | පුරුෂ | නො.03, අමුහේන්කන්ද, පරකඩුව | 0716197694 |
| 41 | ගරු මන්ත්‍රී | එස්.ඩබ්.රංජිත් මැන්දිස් මහතා | එ.ජ.නි.ස. | පුරුෂ | ලක්ෂිත කීරගල, කොස්වත්ත, කුරුවිට. | 0776346072 |
| 42 | ගරු මන්ත්‍රී | ඩබ්.කේ. තිලකාවතී මහත්මිය. | එ.ජ.නි.ස. | ස්ත්‍රී | හල්පේ, දොඩම්පේ | 0718171061 |
| 43 | ගරු මන්ත්‍රී | එම්.විකසිත පුෂ්ප සූරිය මහතා | ජ.වි.පෙ | පුරුෂ | උළුගෙදර,වතුයාය, කුරුවිට. | 0770254977 |
| 44 | ගරු මන්ත්‍රී | පී.ඒ. ජයසිංහ මහතා | ජ.වි.පෙ | පුරුෂ | 36/බී, දිගෝ ගෙදර, | 0772279085 |
| 45 | ගරු මන්ත්‍රී | එස්.බී. ජීවන් රණතුංග මහතා | ස්වාධීන | පුරුෂ | 318/1/1,ඉදලකැටිය,හිදැල්ලන | 0712642271 |

# ගරු සභාපතිතුමාගේ පණිවිඩය

විවිධ ආර්ථික අභියෝග හමුවේ 2022 වසර අවසානයේ 2023 වසර සඳහා වන නව අය - වැය මෙලෙස ඔබ වෙත ඉදිරිපත් කරමි. කුරුවිට බල ප්‍රදේශයේ ජනතාවට සමීපතම දේශපාලන නියෝජිතයා ලෙස එකී බල ප්‍රදේශයේ සියළුම ජනතාවගේ ජීවන තත්ත්වය හා සුබ විහරණය වඩාත් නංවා සිටුවීමට අවශ්‍ය කටයුතු සිදු කර දීම මාගේ එකම අරමුණයි.

2023 වර්ෂයේ ඉටු කළ යුතු මූලික අවශ්‍යතා ලෙස කුරුවිට නගරයේ වැසිකිළිය අළුත්වැඩියා කිරීම, කුරුවිට නගරයේ අත්‍යාවශ්‍ය ව පැවති ආසන 1000 කට වඩා පිරිසක් අසුන් ගත හැකි වන පරිදි ADB ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම අවසන් කිරීම හා සභාවේ ආදායම වැඩි කිරීම වෙනුවෙන් ඉන්ධන පිරවුම් හලක් ආරම්භ කිරීම ප්‍රාග්ධන ආයෝජන ලෙස දැක්විය හැකියි.

එසේම දෛනිකව සිදු කරනු ලබන ප්‍රාදේශීය සභාවේ ඝන අපද්‍රව්‍ය රැස් කිරීමේ වැටසටහන ක්‍රියාත්මක කිරීම හා පොහොරබාව කසළ අංගනයේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ක්‍රියාත්මක කිරීම යන ආදිය 2023 වර්ෂයේ අප ඉටු කිරීමට බලා පොරොත්තු වේ. එසේම බල ප්‍රදේශයේ දූ පුතුන්ගේ අධ්‍යාපනික අභිවෘද්ධිය උදෙසා ප්‍රාදේශීය සභා පුස්තකාල හතර වෙත පොත් පත් ලබා දීම ද ප්‍රධාන පුස්තකාලය තාක්ෂණයෙන් සවි බල ගැන්වීමට ද ,බල ප්‍රදේශයේ ඩෙංගු උවදුර මැඩලීම උදෙසා කටයුතු කිරීම ආදි ජනතාවට සමීප අත්‍යවශ්‍ය සේවා රැසක් ඉටු කිරීමට ද බලාපොරොත්තු වෙමි.

එසේම කිරිඇල්ල උප කාර්යාලයේ වහලය හා ලේඛණාගාරය සකස් කිරීම,කාර්යාල තුළ සේවකයන් සඳහා වැසිකිළි ඉදිකිරීම,ප්‍රදේශයේ මාර්ග අත්‍යාවශ්‍යතාවය මත කොන්ක්‍රීට් කිරීම, වීදි පහන් සවි කිරීම හා ප්‍රදේශයේ ජනතාවට විසල් රත්නපුර ජල ව්‍යාපෘතියෙන් හා කුඩා නගර ජල ව්‍යාපෘතියෙන් පානීය ජල ගැටළුව ට පිළියම් යෙදීම ආදී සංවර්ධන කටයුතු

රාශියක් 2023 වසරේ ගරු උපසභාපති තුමා ඇතුළු ගරු මන්ත්‍රී තුමන් හා තුමියන්ලා ගේ සහයෙන් සිදු කිරීමට බලා පොරොත්තු වෙමි.

එසේම නිරතුරුවම අපව දිරිමත් කරමින් අපට සවියක් වූ සබරගමුව පළාත් සභාවේ ගරු අණ්ඩුකාර වර , ප්‍රධාන ලේකම්,ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්,පළාත් පාලන කොමසාරිස්තුමා,පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා,විමර්ශන නිලධාරි හා ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් අප වෙත ලබා දෙන සහයෝගයට හා මෙම සියළු කාර්යයන් ඉටු කිරීමට තම බදු මුදල් ලබා දෙන්නා වූ කිරිඇල්ල හා කුරුවිට ප්‍රදේශයේ මහජනතාවට ගෞරවනීය ස්තූතිය පළකරන අතර, ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතුව 2023 වසර වඩාත් ඵලදායී සාර්ථක වසරක් ලෙස පත් කර ගැනීමට හැකිවේවායි පතමි.

ප්‍රේමරත්න මල්කැකුල,

සභාපති,

ප්‍රාදේශීය සභාව,

කුරුවිට

## ප්‍රාදේශීය සභා ලේකම්තුමියගේ පණිවිඩය

ප්‍රාදේශීය සංවර්ධන ප්‍රයත්නයේ ප්‍රමුඛතම කාර්යයභාරයක් ඉටු කරන මහජන සුභසාධනය හා පොදු උපයෝගිතා සේවා උපරිම කාර්යක්ෂමතාවයෙන් සලසන්නා වූ කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද්දා වූ වාර්ෂික අය-වැය ලේඛනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 168 සිට 170 දක්වා වගන්ති ප්‍රකාරව මේ සමඟ ඉදිරිපත් කරමි

එහිදී අප ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන පරිපාලන සේවා,සෞඛ්‍ය සේවා,භෞතික සැලසුම්, ඉඩම් මංමාවත් හා ගොඩනැගිලි, මහජන උපයෝගිතා සේවා හා සුභසාධක සේවා සඳහා ජනතාවට උපරිම සේවයක් සැලසෙන ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙවර අපගේ අයවැයෙ හි මුළු පුනරාවර්ථන ආදායම රු.108,314,477.22 ක් වේ. ඇස්තුමේන්තුගත මුළු පුනරාවර්ථන වියදම රු.108,887,708.00 කි.තවද ඇස්තමේන්තු ගත මුළු ප්‍රාග්ධන ආදායම රු.29,180,000 ක් වන අතර ප්‍රාග්ධන වියදම රු. 87,300,000 ක් වේ. ඒ අනුව ඇස්තමේන්තු ගත මුළු ආදායම රු.196,194,425.22 ක් වන අතර ඇස්තුමේන්තුගත මුළු වියදම රු.196,187,708.00 ක් වේ.

ප්‍රාදේශීය සභාව ට හිමි වරිපනම්,අක්කර බදු,කඩ කුලී,ආදාහනාගාර ගාස්තු,කසල එකතු කිරීමේ ගාස්තු, උසාවි දඩ ,මුද්දර ගාස්තු හා අනෙකුත් ආදායම් මාර්ග තුලින් මෙන්ම රේඛීය අමාත්‍යංශ , පළාත් සභා ඇතුළු අනෙකුත් ආයතන වලින් ලැබෙන ප්‍රතිපාදන ආදායම් ප්‍රභවයන් යටතේ ලැබෙන ආදායමින් සභා කාර්යාල නඩත්තු කිරීම හා අළුත් වැඩියාවන් සිදු කිරීමට අමතරව ප්‍රදේශයට අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු ද ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා,උප සභාපති තුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සමඟ හා සමස්ථ මාගේ කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව ඉටු කිරීමට බලා පොරොත්තු වෙමි.

එලෙස කාර්යක්ෂමතාවය හා සඵලදායිත්වය තුළින් කටයුතු ඉටු කිරිමෙන් සබරගමුව පළාත් සභාව තුල කීර්තිමත්ම ප්‍රාදේශීය  සභාව බවට පත් කිරීම සහ සමස්ථ දිවයිනේම බබලන දියුණුම ප්‍රාදේශීය සභාව බවට  කුරුවිට ප්‍රාදේශීය සභාව ඉහළින් ඔසවා තැබීම මා ප්‍රමුඛ සමස්ථ කාර්ය මණ්ඩලයේම අපේක්ෂාව හා මුඛ්‍ය පරමාර්ථය බව අභිමානයෙන් යුක්තව ප්‍රකාශ කර සිටිමු.

සුධර්මා වීරක්කොඩි,

ලේකම්,

ප්‍රාදේශීය සභාව,

කුරුවිට.

# කුරුවිට ප්‍රාදේශීය සභාවේ පොදු තොරතුරු.

| | | | |
|---|---|---|---|
| පළාත | -: සබරගමුව | | |
| පරිපාලන දිස්ත්‍රික්කය | -: රත්නපුර | | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | -: කුරුවිට, කිරිඇල්ල. | | |
| බල ප්‍රදේශයේ විශාලත්වය | -: කුරුවිට - ව.කි.මී.174.50 | | |
| | කිරිඇල්ල - ව.කි.මී.78.78 | | |
| ජනගහනය | -: | **කුරුවිට** | **කිරිඇල්ල** |
| | ස්ත්‍රී | 53,788 | 17,951 |
| | පුරුෂ | 49,610 | 17,537 |
| | **එකතුව** | 103,398 | 35,488 |
| ජනඝනත්වය | -: කුරුවිට | 592.53 | |
| | කිරිඇල්ල | 449.67 | |
| ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | -: කුරුවිට | 75015 | |
| | කිරිඇල්ල | 26608 | |

| | |
|---|---|
| මන්ත්‍රී සංඛ්‍යාව | -: 45 |
| අනුමත සේවක සංඛ්‍යාව | -: 87 |
| මාතෘ සායන | -: 02 |
| පොදු වැසිකිලි ප්‍රමාණය | -: 02 |
| සුසාන භූමි | -:01 |

**සභාව සතු වාහන**

| | |
|---|---|
| කැබ් රථ | -: 03 |
| කෘෂ කැබ් රථ | :- 01 |
| ත්‍රී රෝද රථ | -:02 |
| ගලිබවුසර් | -:02 |
| ෆෝටෝන් ටිපර් රථ | -:01 |
| ජල බවුසර් | -: 01 |
| ට්‍රැක්ටර් එංජින් | -: 09 |
| ට්‍රැක්ටර් ටේලර් | -: 06 |
| මෝටර් බෝට්ටු | -:01 |

**යන්ත්‍රෝපකරණ**

| | |
|---|---|
| බොබ්කැට් යන්ත්‍රය | -:01 |
| මාර්ග තලනය | -:01 |
| JCB බැකෝ යන්ත්‍රය | -:01 |
| තණකොළ කපන මැෂින් | 0 -:3 |

| | |
|---|---|
| වරිපනම් බදු ප්‍රතිශතය | -: 6% |
| ප්‍රධාන ක්‍රීඩා පිටි | -: 02 |
| සභාව සතු පෙරපාසල් | :- 01 |
| රැස්වීම් ශාලා | -:01 |
| වරිපනම් බදු දේපල සංඛ්‍යාව | : 4074 |
| අක්කර බදු දේපල සංඛ්‍යාව | -: 222 |
| 1% ව්‍යාපාර බදු ගෙවන සංඛ්‍යාව | :- 04 |

පොදු වෙළඳපල සංකීර්ණ

කුරුවිට -: 05

කිරිඇල්ල -: 01

පොදු වෙළඳපල කඩකාමර

කුරුවිට -:100

කිරිඇල්ල -:10

**පුස්තකාල )111( ශ්‍රේණිය**

කුරුවිට -: 01

කිරිඇල්ල -: 01

එල්ලාවල -: 01

දොඩම්පේ -: 01

මස්කඩ /මාළුකඩ සභාව සතු -: 06

ගෝසාතකාගාරය පෞද්ගලික :- 02

ජල යෝජනා ක්‍රම :- 03

දේපල තක්සේරු කල වර්ෂය : 2008/2015

වෙළඳ බලපත්‍ර : 3000

පරිසර බලපත්‍ර -:120

කුලියට දෙනු ලබන කඩ ගණන :- 119

සතිපොලවල් -සභාව සතු -: 01

කුරුවිට තාවකාලික කඩ -: 79

විථි පහන් 23W -: 3925

150 W -: 811

මාර්ග කොන්ක්‍රීට් කිරිම 2022 -:

## 2022.07.01 - 2022.09.30 දිනට කාර්යමණ්ඩල තොරතුරු

**දිස්ත්‍රික්කය - රත්නපුර** **පළාත් පාලන ආයතනය - කුරුවිට ප්‍රාදේශීය සභාව**

| අනු අංකය | අනුමත තනතුරු නාමය | සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව | | | සේවයේ නියුතු ප්‍රමාණය | | පුරප්පාඩු සංඛ්‍යාව (4+5+6+7+8) | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | (02) | (03) | ස්ථිර පදනමින් | | කොන්ත්‍රාත් පදනමින් (06) | ස්ථිර (07) | අනියම් ආදේශක හෝ කොන්ත්‍රාත් (08) | | |
| | | | දරන්නාට පෞද්ගලික නොවන සේ (04) | දරන්නාට පෞද්ගලික වන සේ (05) | | | | | |
| 1. | ලේකම් | PPMS OS | 01 | | | 01 | 00 | 00 | |
| 2. | ආයුර්වේද වෛද්‍ය | SLAY MS | 01 | | | 01 | 00 | 00 | |
| 3. | සංවර්ධන නිලධාරි | DOS | 16 | | | 27 | 00 | -11 | |
| 4. | තාක්ෂණ නිලධාරි | SLTS | 02 | | | 02 | 00 | 00 | |
| 5. | පුස්තකාලයාධිපති | SLGLS | 02 | | | 01 | 00 | 01 | |
| 6. | කළමනාකරණ සේවා නිලධාරි | PPMS OS | 11 | | | 11 | 00 | 00 | |
| 7. | ආදායම් පරික්ෂක | Dept. | 03 | | | 02 | 00 | 01 | |
| 8. | පෙර පාසල් පාලිකා | Dept. | 01 | | | 01 | 00 | 00 | |
| 9. | පොදු වෙළඳසැල් පරීක්ෂක | Dept. | 01 | | | 00 | 00 | 01 | |
| 10. | රියදුරු | PDS | 05 | | 03 | 03 | 02 | 02 | |
| 11. | විදුලි කාර්මික | Dept. | 01 | | | 00 | 01 | 01 | |
| 12. | ආයුර්වේද ඖෂධ සංයෝජක | Dept. | 01 | | | 01 | 00 | 00 | |
| 13. | ආදාහනාගාර ක්‍රියාකරු | Dept. | 01 | | | 00 | 00 | 01 | |
| 14. | පුස්තකාල සහායක | Dept. | 03 | | | 02 | 00 | 01 | |
| 15. | ආදාහනාගාර සහායක | Dept. | 01 | | | 00 | 00 | 01 | |
| 16. | කාර්යාල කාර්ය සහායක | Dept. | 05 | | | 05 | 00 | 00 | |
| 17. | මුරකරු | Dept. | 04 | 03 | | 03 | 01 | 04 | |
| 18. | වැඩ ක්ෂේත්‍ර කම්කරු | Dept. | 19 | 03 | | 13 | 01 | 09 | |
| 19. | සෞඛ්‍ය කම්කරු | Dept. | 09 | | | 07 | 11 | 02 | |
| 20. | තාක්ෂණික සහකාර | Dept. | 01 | | | 00 | 00 | 01 | |

# කුරුවිට ප්‍රාදේශීය සභා සංවිධාන සටහන



# 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා අයවැය සාරාංශය

**01.ආදායම් තත්ත්වය**

| | | |
|---|---|---|
| i.සභාවේ උත්පාදිත ආදායම | 108,314,477.22 | |
| ii.ආදායම් ආධාර | 58,699,948.00 | |
| iii. ප්‍රාග්ධන ආධාර | 29,180,000.00 | |
| | | 196,194,425.22 |

<u>අඩුකළා</u>

**02.වියදම් තත්ත්වය**

| | | |
|---|---|---|
| i.පුනරාවර්තන වියදම් | 108,887,708.00 | |
| ii. ප්‍රාග්ධන වැය | 87,300,000.00 | 196,187,708.00 |

| | |
|---|---|
| **අතිරික්තය** | 6,717.22 |

# කුරුවිට ප්‍රාදේශීය සභාව – 2023 වර්ෂය සඳහා ආදායම් සාරාංශය

| ආදායම් සංකේත හා අයවිෂය නාමය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | වෙනත් පොදු උපයෝගිතා සේවා | සුභසාධක සේවා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| 10. වරිපනම් හා බදු | 6,643,337.20 | 996,400.00 | 300,000.00 | | 100,000.00 | 8,039,737.20 | 4.10 |
| 20. කුලී | | | 178,420.00 | 9,441,870.02 | | 9,620,290.02 | 4.90 |
| 30.බලපත්‍රගාස්තු | 1,215,050.00 | 1,096,750.00 | | | | 2,311,800.00 | 1.18 |
| 40.සේවා සඳහා ගාස්තු | 53,600.00 | 4,250,000.00 | 900,000.00 | 2,735,000.00 | 30,000.00 | 7,968,600.00 | 4.06 |
| 50. වරෙන්තු හා දඩ | 6,560,000.00 | | 1,050.00 | 310,000.00 | 3,000.00 | 6,874,050.00 | 3.50 |
| 60. වෙනත් ආදායම් | 71,385,000.00 | 35,000.00 | 75,000.00 | 2,000,000.00 | 5,000.00 | 73,500,000.00 | 37.46 |
| 70. ආදායම් ආධාර | 38,329,988.00 | 5,823,440.00 | 10,924,680.00 | 1,468,800.00 | 2,153,040.00 | 58,699,948.00 | 29.92 |
| 80.මූලධන ආධාර | | | 20,000,000.00 | 9,180,000.00 | | 29,180,000.00 | 14.87 |
| **මුළු ආදායම්** | **124,186,975.20** | **12,201,590.00** | **32,379,150.00** | **25,135,670.02** | **2,291,040.00** | **196,194,425.22** | 100.00 |
| අඩුකලා පුනරාවර්ථන වියදම | 55,714,988.00 | 24,210,400.00 | 17,475,480.00 | 8,888,800.00 | 2,598,040.00 | 108,887,708.00 | |
| පුනරාවර්ථන වියදම වඩා වැඩිවූ ආදායම | 68,471,987.20 | (12,008,810.00) | 14,903,670.00 | 16,246,870.02 | (307,000.00) | 87,306,717.22 | |

# කුරුවිට ප්‍රාදේශීය සභාව - 2022 වර්ෂය සඳහා ආදායම් සාරාංශය

| ආදායම් සංකේත හා අයවිෂය නාමය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | වෙනත් පොදු උපයෝගිතා සේවා | සුභසාධක සේවා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| 10. වරිපනම් හා බදු | 6,227,805.01 | 900,650.00 | 300,000.00 | | 500.00 | 7,428,955.01 | 4.83 |
| 20. කුලි | | | 53,420.00 | 9,042,696.53 | | 9,096,116.53 | 5.92 |
| 30.බලපත්‍රගාස්තු | 1,130,100.00 | 1,074,150.00 | | | | 2,204,250.00 | 1.43 |
| 40.සේවා සඳහා ගාස්තු | 103,600.00 | 3,550,000.00 | 825,000.00 | 2,610,220.00 | 3,000.00 | 7,091,820.00 | 4.61 |
| 50. වරෙන්තු හා දඩ | 5,100,000.00 | | 100.00 | 300,000.00 | 1,700.00 | 5,401,800.00 | 3.51 |
| 60. වෙනත් ආදායම් | 50,985,000.00 | 600,000.00 | 20,000.00 | 1,885,160.00 | 5,000.00 | 53,495,160.00 | 34.80 |
| 70. ආදායම් ආධාර | 28,162,809.24 | 5,050,920.00 | 9,278,160.84 | 865,200.00 | 1,946,700.00 | 45,303,790.08 | 29.47 |
| 80.මූලධන ආධාර | | | 20,000,000.00 | 3,711,940.00 | | 23,711,940.00 | 15.42 |
| මුළු ආදායම | 91,709,314.25 | 11,175,720.00 | 30,476,680.84 | 18,415,216.53 | 1,956,900.00 | 153,733,831.62 | 100.00 |
| පුනරාවර්ථන වියදම | 45,237,809.24 | 21,015,650.00 | 16,061,698.84 | 5,166,200.00 | 2,849,938.00 | 90,331,296.08 | |
| පුනරාවර්ථන වියදම වඩා වැඩිවූ ආදායම් | 46,471,505.01 | (9,839,930.00) | 14,414,982.00 | 13,249,016.53 | (893,038.00) | 63,402,535.54 | |


ආදායම් සාරාංශය
250,000,000.00
200,000,000.00
150,000,000.00
100,000,000.00
50,000,000.00
-
2022
2023
10. වරිපනම් හා බදු
20. කුලී
30.බලපත්‍රගාස්තු
40.සේවා සඳහා ගාස්තු
50. වරෙන්තු හා දඩ
60. වෙනත් ආදායම්
70. ආදායම් ආධාර
80.මූලධන ආධාර

# කුරුවිට ප්‍රාදේශීය සභාව - 2023 වර්ෂය සඳහා වියදම් සාරාංශය

| වියදම් සංකේත හා වැයවිෂය නාමය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම්,මංමාවත්,ඉඩම් හා ගොඩනැගිලි | වෙනත් පොදු උපයෝගිතා සේවා | සුභසාධක සේවා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| 01.වැටුප් හා වේතන | 39,919,988.00 | 13,215,400.00 | 13,435,480.00 | 1,468,800.00 | 2,203,040.00 | 70,242,708.00 | 35.80 |
| 02.ගමන් වියදම් | 700,000.00 | 15,000.00 | 100,000.00 | | 10,000.00 | 825,000.00 | 0.42 |
| 03.සැපයුම් හා උපකරණ | 7,000,000.00 | 3,510,000.00 | 1,800,000.00 | | 125,000.00 | 12,435,000.00 | 6.34 |
| 04.ප්‍රාග්ධන වත්කම් අ.වැ. හා නඩත්තුව | 2,350,000.00 | 6,000,000.00 | 1,000,000.00 | 2,900,000.00 | 100,000.00 | 12,350,000.00 | 6.29 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 3,995,000.00 | 670,000.00 | 1,020,000.00 | 4,520,000.00 | 50,000.00 | 10,255,000.00 | 5.23 |
| 06.පොලී ගෙවීම් | | | | | | - | - |
| 07. ආධාර හා දායක මුදල් | 1,600,000.00 | | | | 110,000.00 | 1,710,000.00 | 0.87 |
| 08.විශ්‍රාම වැටුප් | 150,000.00 | 800,000.00 | 120,000.00 | | | 1,070,000.00 | 0.55 |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | **55,714,988.00** | **24,210,400.00** | **17,475,480.00** | **8,888,800.00** | **2,598,040.00** | **108,887,708.00** | **55.50** |
| 09.ප්‍රාග්ධන වැය | 3,000,000.00 | 10,500,000.00 | 52,500,000.00 | 17,000,000.00 | 4,300,000.00 | 87,300,000.00 | 44.50 |
| මුළු එකතුව | **58,714,988.00** | **34,710,400.00** | **69,975,480.00** | **25,888,800.00** | **6,898,040.00** | **196,187,708.00** | **100.00** |

# කුරුවිට ප්‍රාදේශීය සභාව - 2022 වර්ෂය සඳහා වියදම් සාරාංශය

| වියදම් සංකේත හා වැයවිෂය නාමය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම්,මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | වෙනත් පොදු උපයෝගිතා සේවා | සුභසාධක සේවා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| 01.වැටුප් හා වේතන | 29,572,809.24 | 12,589,850.00 | 11,653,948.84 | 865,200.00 | 2,401,288.00 | 57,083,096.08 | 27.66 |
| 02.ගමන් වියදම් | 800,000.00 | 25,000.00 | 175,000.00 | 1,000.00 | 10,000.00 | 1,011,000.00 | 0.3 |
| 03.සැපයුම් හා උපකරණ | 6,040,000.00 | 2,305,000.00 | 1,100,000.00 | | 150,000.00 | 9,595,000.00 | 4.9 |
| 04.ප්‍රාග්ධන වත්කම් අ.වැ. හා නඩත්තුව | 1,950,000.00 | 4,700,000.00 | 1,200,000.00 | 800,000.00 | 100,000.00 | 8,750,000.00 | 2.97 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 4,100,000.00 | 600,000.00 | 1,800,000.00 | 3,500,000.00 | 35,000.00 | 10,035,000.00 | 4.01 |
| 06.පොලී ගෙවීම් | | | | | 110,000.00 | 110,000.00 | 0.28 |
| 07. ආධාර හා දායක මුදල් | 2,650,000.00 | | | | 43,650.00 | 2,693,650.00 | 0.87 |
| 08.විශ්‍රාම වැටුප් | 125,000.00 | 795,800.00 | 132,750.00 | | | 1,053,550.00 | 0.44 |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | **45,237,809.24** | **21,015,650.00** | **16,061,698.84** | **5,166,200.00** | **2,849,938.00** | **90,331,296.08** | **41.46** |
| 09.ප්‍රාග්ධන වැය | 1,000,000.00 | 1,700,000.00 | 50,000,000.00 | 9,500,000.00 | 1,200,000.00 | 63,400,000.00 | 57.48 |
| 10. ණය වාරික ගෙවීම | | | | | | - | 1.06 |
| **මුළු එකතුව** | **46,237,809.24** | **22,715,650.00** | **66,061,698.84** | **14,666,200.00** | **4,049,938.00** | **153,731,296.08** | **100.00** |

# ඇස්තමේන්තු ගත වියදම



## කුරුවිට ප්‍රාදේශීය සභාව - 2022 වර්ෂය සඳහා ප්‍රාග්ධන අයවැය සාරාංශය

| සංකේත විස්තරය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | පොදු උපයෝගිතා සේවා | සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|
| ඇමුණුම 01 අනුව පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම | 45,271,505.01 | (9,839,930.00) | 14,414,982.00 | 13,249,016.53 | (893,038.00) | 62,202,535.54 |
| අඩුකලා :- 1.ප්‍රාග්ධන වැය | 1,000,000.00 | 1,700,000.00 | 50,000,000.00 | 9,500,000.00 | 1,200,000.00 | 63,400,000.00 |
| වෙනස | 44,271,505.01 | (11,539,930.00) | (35,585,018.00) | 3,749,016.53 | (2,093,038.00) | (1,197,464.46) |

## කුරුවිට ප්‍රාදේශීය සභාව - 2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන අයවැය සාරාංශය

| සංකේත විස්තරය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | පොදු උපයෝගිතා සේවා | සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|
| ඇමුණුම 01 අනුව පුනරාවර්තන වියදම වඩා වැඩිවූ ආදායම | 68,471,987.20 | (12,008,810.00) | 14,903,670.00 | 16,246,870.02 | (307,000.00) | 87,306,717.22 |
| අඩුකලා :- ප්‍රාග්ධන වැය | 3,000,000.00 | 10,500,000.00 | 52,500,000.00 | 17,000,000.00 | 4,300,000.00 | 87,300,000.00 |
| ණය වාරික | | | | - | | |
| වෙනස | 65,471,987.20 | (22,508,810.00) | (37,596,330.00) | (753,129.98) | (4,607,000.00) | 6,717.22 |

# ප්‍රාග්ධන වියදම් ඇස්තුමේන්තුව

| වැය විෂය හා විෂය සංකේතය | 2023 | 2022 |
|---|---|---|
| **01.** **පොදු පරිපාලනය**<br>109 ප්‍රාග්ධන වැය | 3,000,000.00 | 1,000,000.00 |
| **02.** **සෞඛ්‍ය සේවා**<br>209ප්‍රාග්ධන වැය | 10,500,000.00 | 1,700,000.00 |
| **03.භෞතික සැලසුම්,මංමාවත්,ඉඩම් හා ගොඩනැගිලි**<br>309 ප්‍රාග්ධන වැය | 52,500,000.00 | 50,000,000.00 |
| **05.** **පොදු උපයෝගිතා සේවා**<br>509 ප්‍රාග්ධන වැය | 17,000,000.00 | 9,500,000.00 |
| **06.** **සුභ සාධක සේවා**<br>609 ප්‍රාග්ධන වැය | 4,300,000.00 | 1,200,000.00 |
| එකතුව | 87,300,000.00 | 63,400,000.00 |

# වැඩ සටහන් අංක 01
# පොදු පරිපාලනය



# විස්තරාත්මක ආදායම් ඇස්තමේන්තුව -2023

## වැඩසටහන් අංක 01 - පෙදු පරිපාලනය

2022 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇති පුනරාවර්ථන ආදායම් ප්‍රභවයන් පිළිබඳ සාරාංශ ගත විස්තරක් මෙසේය.

### 1- 11 වරිපනම් බදු

ප්‍රාදේශීය සභාපනතේ 134(1,2) වගන්ති ප්‍රකාරව මෙම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය කිරීම කරනු ලබයි .දැනට 2008 වර්ෂයේ හා 2015 වර්ෂයේ නව වරිපනම් ප්‍රදේශ සඳහා කරන ලද වාර්ෂික තක්සේරු වටිනාකම මත මෙම වරිපනම් බදු අය කරන අතර ,ඒ සඳහා මෙම සභාව විසින් දේපළ වල වාර්ෂික වටිනාකම මත 6% ක මුදලක් වරිපනම් බදු ලෙස අයකරනු ලබයි.ඒ අනුව වරිපනම් බදු වෙනුවෙන් රු. 6,564,946.40 ක මුදලක් 202 3වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර ඇත.

### 1- 12 අක්කර බදු

ප්‍රාදේශීය සභාපනතේ 134(3) වගන්තියට අනුව බල ප්‍රදේශය තුල පිහිටියාවූ ස්ථිර හෝ නිතිපතා ගොඩනැගිල්ලක් යටතේ වූ ද එක් එක් ඉඩම් හෙට්ටයාරය මත පහත දක්වා ඇති අනුප්‍රමාණය නොඉක්ම වන අක්කර බද්දක් අය කල හැකිය.

ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 5ක් හෝ ඊට වැඩි වන අවස්ථාවක රු.10.00 ක් ද වශයෙන් අක්කර බද්දක් අය කිරීමට 2023 වර්ෂයේ ඇස්තමේන්තු කර ඇත.

ඒ අනුව අක්කර බදු සඳහා රු. 78,390.80 ක මුදලක් 2023 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර ඇත.

### 1- 35 වාහන හාසත්ව බදු

ප්‍රාදේශීය සභාපනතේ 134(3) වගන්තියට අනුව කරන ලබන වාහන හාසතුන් පිළිබඳ බද්දක් අය කිරීමට හැකිය.මේ මගින් එක් පාපැදියක් සඳහා රු .26.00 ක ගාස්තුවක් අය කරයි.

ඒ අනුව වාහන හාසත්ව බදු සඳහා රු.50. 00ක මුදලක් 2023 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර ඇත.

### 1– 37 ප්‍රචාරක දැන්වීම් ගාස්තු

සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා ගාස්තු පහත පරිදි අය කරනු ලබයි.තවද වෙළඳ ආයතනයේ නම් සඳහන් පුවරු සඳහා මෙම ගාස්තු අදාළ නොවන අතර වාණිජ කටයුක්තක් ඉලක්ක කර ගෙන ඇති වෙළඳ ආයතනයේ නම් සඳහන් පුවරු සඳහා ගාස්තු අය කරනු ලැබේ.

1. වෙළඳ ප්‍රචාරණ බැනර් වර්ග අඩියකට රු.100.00
2. ස්ථිර දැන්වීම් පුවරු වර්ග අඩියකට රු.150.00

ඒ අනුව ස්ථිර හා තාවකාලික ප්‍රචාරක දැන්වීම් ගාස්තු සඳහා රු.1,215,000.00 ක මුදලක් 2022 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර ඇත .

**1– 41ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු**

මේ යටතේ,

I. **සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.**

මෙම ආයතනයට අවශ්‍ය ද්‍රව්‍ය,සැපයුම් හා සේවාවන් ලබාගැනීමට සුදුසු ආයතන වෙතින් මුදල් වර්ෂයට පෙර වර්ෂයේ ඔක්තෝම්බර් මස සිට ලියාපදිංචි වීමට කැමති දේශීය නිෂ්පාදකයින් සැපයුම්කරුවන් හා ආයතන වෙතින් ලබාගන්නා ලියාපදිංචි ගාස්තු ලෙස රු.50,000.00ක මුදලක් 2023 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර ඇත.

II. **නිල දුරකථනයට හා කාබ් රථයට මුදල් ගෙවීම.**

පළාත් පාලන චක්‍ර ලේඛනයට අනුව ගරු සභාපතිතුමා භාවිතා කරන කාබ් රථය සඳහා ගරු සභාපතිතුමා විසින් රු.3,600. 00මුදලක් මෙම සභාව වෙත ලබාදෙනු ඇතැයි 2023 වර්ෂයේ ඇස්තමේන්තු කර ඇත.

**1– 51අධි ගාස්තු**

මෙම සභාවේ පරිපාලන කටයුතු වෙනුවෙන් අය කරනු ලබන ප්‍රමාද දඩ,වාචුප් රහිත නිවාඩු හා වෙනත් දඩ වෙනුවෙන් රු.50,000.00ක මුදලක් 2023 වර්ෂයේ ඇස්තමේන්තු කර ඇත.

**1- 52උසාවි දඩ**

ප්‍රාදේශිය සභා පනත,වෙනත් අණ පනත් හා නීතිය ක්‍රියාත්මක කිරීම තුලින් උසාවිය විසින් අය කර ගන්නා වූ සභා බල ප්‍රදේශයන්ට අදාළ වූ දඩ මුදල් වලින් 2023 වර්ෂයේ ප්‍රාදේශිය සභාව වෙත ලැබේ යැයි අපේක්ෂිත ආදායම ලෙස රු.6,500,000.00 ක මුදලක් මේ යටතේ ඇස්තමේන්තු කර ඇත.

**1- 61.ආයෝජන පොළී**

මේ යටතේ සභාව සතු ආදායමින් සථිර තැන්පත් ලෙස ආයෝජනය කරන ලද මුදල වෙනුවෙන් ලැබෙන ආදායම දක්වේ .ඒ අනුව ලංකා බැංකුව හා ප්‍රදේශිය සංවර්ධන බැංකුවෙහි ආයෝජිත මුදලට පොළිය ලෙස රු.35,000.00.මුදලක් ඇස්තමේන්තු කර ඇත.

**1- 62විකුණුම් )මුද්‍රිත පෝරම හා අබලි ද්‍රව්‍ය(**

මේ යටතේ වරිපනම් බදු නොගෙවන බවට ලබාදෙන සහතිකය සඳහා ගාස්තුව ,අනතුරුදායක ගස් සඳහා නිකුත් කරනු ලබන අයදුම් පත්‍ර ගාස්තුව හා කාර්යාලීය අබලි ද්‍රව්‍ය අලෙවි කිරීම හා වෙනත් විකුණුම් සඳහා ලැබේ යැයි අපේක්ෂිත ආදායම ලෙස රු.850,000.00 ක ආදයමක් මේ යටතේ දක්වා ඇත .

**1- 63-1. අභ්‍යන්තර බිල් කිරීම් -මුද්දර ගාස්තු**

සභාබල ප්‍රදේශයේ සංවර්ධනයත් සමගම සිදුවන ඉඩම් ගණුදෙනු හරහාමුද්දර ගාස්තු වශයෙන් ලැබේ යැයි අපේක්ෂිත ආදායම ලෙස පසුගිය වසරට සාපේක්ෂව රු.70,000,000.00 ක මුදලක් මේ යටතේ දක්වා ඇත.

**1- 64. සේවක ණය පොළී**

සභා කාර්යය මණ්ඩලය වෙනුවෙන් ආපදා අවස්ථා සඳහා හා දසමස් ණය ලෙස ලබා දෙනු ලබන ණය මුදල් වෙනුවෙන් අය කර ගනු ලබන පොළිය රු. 500,000. 00 ක මුදලක් මේ යටතේ දක්වේ .

**1- 71.1.සේවක වැටුප් ප්‍රතිපූර්ණය**

මෙම සභාවේ අනුමත කාර්යය මණ්ඩලයෙන් පොදු පරිපාලනයට සම්බන්ධ නිලධාරීන් වෙත ගෙවනු ලබන සේවක වැටුප වෙනුවෙන් ප්‍රතිපූර්ණ වේ යැයි අපේක්ෂිත මුදල ලෙස රු.30,049,988.00 ක මුදලක් මේ යටතේ දක්වේ .

**71.2. මන්ත්‍රී දීමනා**

ගරු සභාපති ,උප සභාපති හා මන්ත්‍රීවරුන් 43දෙනාවෙනුවෙන් ගෙවනු ලබන දීමනා සඳහා ප්‍රතිපූර්ණය වේ යැයි අපේක්ෂිත මුදල ලෙස රු .8,280,000.00 ක මුදලක් මේ යටතේ දක්වේ .

# 01.පොදු පරිපාලනය - 2023 ආදායම් ඇස්තමේන්තුව

| අය විෂය නාම හා වැය විෂය සංකේත | 2021 සත්‍ය ආදායම | 2022 ආදායම් ඇස්තමේන්තුව | 2022.06.30 ට ආදායම | 2023 ආදායම් ඇස්තමේන්තුව | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | උපකාර්යාලය | | | | එකතුව |
| | | | | එල්ලාවල | කිරිඇල්ල | දොඩම්පේ | ප්‍රධාන | |
| 10.වරිපනම් බදු | | | | | | | | |
| 11. වරිපනම් | 2,237,422.35 | 6,149,266.29 | 1,420,495.37 | 2,117,928.16 | 362,132.12 | | 4,084,886.12 | 6,564,946.40 |
| 12. අක්කර බදු | 26,207.67 | 78,538.72 | 10,684.27 | 33,591.00 | 8,130.08 | 11,040.00 | 25,629.72 | 78,390.80 |
| එකතුව | **2,263,630.02** | **6,227,805.01** | **1,431,179.64** | **2,151,519.16** | **370,262.20** | **11,040.00** | **4,110,515.84** | **6,643,337.20** |
| 30.බලපත්‍ර ගාස්තු | | | | | | | | |
| 35. වාහන හා සත්ව බදු | 3,106.00 | 100.00 | 38.00 | | | | 50.00 | 50.00 |
| 37. ප්‍රචාරක දැන්වීම් ගාස්තු - ස්ථිර | 1,077,060.00 | 1,100,000.00 | 779,950.00 | | | | 1,200,000.00 | 1,200,000.00 |
| ප්‍රචාරක දැන්වීම් ගාස්තු -තාවකාලික | 22,600.00 | 30,000.00 | | | | | 15,000.00 | 15,000.00 |
| එකතුව | **1,102,766.00** | **1,130,100.00** | **779,988.00** | **-** | **-** | **-** | **1,215,050.00** | **1,215,050.00** |
| 40. සේවා සඳහා ගාස්තු | | | | | | | | |
| 41.ලි.ප.සහතික හා පරික්ෂණ ගාස්තු | | | | | | | | |
| i.සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 82,500.00 | 100,000.00 | 12,350.00 | | | | 50,000.00 | 50,000.00 |
| ii.නිල දුරකථන හා කැබ්රථයට මුදල් ගෙවීම. | 4,200.00 | 3,600.00 | 2,100.00 | | | | 3,600.00 | 3,600.00 |
| එකතුව | **86,700.00** | **103,600.00** | **14,450.00** | **-** | **-** | **-** | **53,600.00** | **53,600.00** |
| 50. වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | | | | | | | | |
| 51. අධිගාස්තු | 54,612.09 | 50,000.00 | 38,400.97 | | | | 50,000.00 | 50,000.00 |
| 52.උසාවි දඩ | 2,947.00 | 5,000,000.00 | 2,309,916.63 | | | | 6,500,000.00 | 6,500,000.00 |
| 53.වියදමින් ආපසු ගැනීම් | 23,483,630.62 | 50,000.00 | 62,166.00 | | | | 10,000.00 | 10,000.00 |
| එකතුව | **23,541,189.71** | **5,100,000.00** | **2,410,483.60** | **-** | **-** | **-** | **6,560,000.00** | **6,560,000.00** |
| 60. වෙනත් ආදායම් | | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 61.ආයෝජන පොලි | 165.31 | 35,000.00 | | | | | 35,000.00 | 35,000.00 |
| 62. විකුණුම් (මුද්‍රිත පෝරම හා අබලි ද්‍රව්‍ය) | 2,021,504.69 | 850,000.00 | 611,052.00 | | | | 850,000.00 | 850,000.00 |
| 63.1. අභ්‍යන්තර බිල් කිරීම් මුද්දර ගාස්තු | 63,762,473.64 | 49,700,000.00 | 16,724,842.00 | | | | 70,000,000.00 | 70,000,000.00 |
| 64. සේවක ණය පොලි | 696,633.30 | 400,000.00 | 269,888.32 | | | | 500,000.00 | 500,000.00 |
| එකතුව | **66,480,776.94** | **50,985,000.00** | **17,605,782.32** | **-** | **-** | **-** | **71,385,000.00** | **71,385,000.00** |
| 70.ආදායම් ආධාර | | | | | | | | |
| 71. 1.සේවක වැටුප් ප්‍රතිපූර්ණය | 20,781,810.83 | 19,882,809.00 | 12,361,835.16 | 2,215,320.00 | 1,725,900.00 | 516,600.00 | 25,592,168.00 | 30,049,988.00 |
| 71.2. මන්ත්‍රී දීමනා | 8,280,000.00 | 8,280,000.00 | 4,140,000.00 | | | | 8,280,000.00 | 8,280,000.00 |
| එකතුව | **29,061,810.83** | **28,162,809.00** | **16,501,835.16** | **2,215,320.00** | **1,725,900.00** | **516,600.00** | **33,872,168.00** | **38,329,988.00** |

# 2023 විස්තරාත්මක වියදම් ඇස්තමේන්තුව

## වැඩසටහන් අංක 01– පොදු පරිපාලනය

20 23 වර්ෂික අයවැය ලේඛනයේ විස්තරාත්මකව දැක්වීම උචිත යැයි හැඟෙන වැය ශීර්ෂ කිහිපයක් පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.

### 101- වැටුප් හා දීමනා

2023 වර්ෂයේ දී පොදු පරිපාලන අංශයේ වැටුප් ගෙවීම සඳහා රු.30,049,988.00 ක මුදලක් වැය වේ යැයි අපේක්ෂා කරමු.

### 101(2) අතිකාල හා නිවාඩු දින වැටුප්

පොදු පරිපාලනය සඳහා සම්බන්ධ වන නිලධාරීන් හා සේවකයන් සඳහා රාජකාරි වේලාවන්ට අමතරව කරනු ලබන අතිකාල සේවා සඳහා ගෙවීම් හා රජයේ නිවාඩු දින වල කරනු ලබන සේවා සඳහා ගෙවීම් මේ යටතේ දැක්වේ.ඒ අනුව 2023 වර්ෂය සඳහා රු.1,000,000.00 ක මුදලක් වැය වේ යැයි අපේක්ෂා කරමු.

### 101(3) නිල ඇඳුම් දීමනා

පොදු පරිපාලනයට සම්බන්ධ නිළ ඇඳුම් දීමනා බ හිමි ආදායම් පරීක්ෂක 01 ක්,රියදුරු 1 ක් හා කා.කා.ස.04 ක් සඳහා රු.90,000.00 ක මුදලක්

වැය වේ යැයි අපේක්ෂා කරමු.

### 101 (9) වෙනත් දීමනා

**i. මන්ත්‍රී දීමනා**

මේ යටතේ ,

සභාපති සඳහා මසකට රු.25,000.00

උපසභාපති සඳහා මසකට රු .20,000.00

මන්ත්‍රීන් සඳහා මසකට රු.15000.00 x 43=රු.645,000.00

බැගින් වර්ෂයකට )රු.25000.00+රු.20000.00+රු.645,000.00) x 12 =රු.8,280,000.00 ක මුදල ක් වැය වේ යැයි අපේක්ෂා කරමු.

**ii ඉටිපත් කළීම භාණ්ඩ දීමනා**

මේ යටතේ පරිගණක දීමනාව ,නිලධාරීන් සඳහා කරනු ලබන දීමනාදක්වේ.ඒ අනුව 2023 වර්ෂයට රු.500,000.00 ක මුදලක් වැය වේ යැයි අපේක්ෂා කරමු.

**<u>102(i (ගමන් වියදම්</u>**

**i .කාර්යය මණ්ඩල නොවන**

සභිකවරුන් හා වෙනත් ආයතන වලින් මෙම සභාව වෙත රාජකාරී කටයුතු සඳහා පැමිණෙන නිලධාරීන් වෙනුවෙන් ගෙවන ගමන් වියදම් මේ යටතේ ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව 2023 වර්ෂයට රු.100,000.00 ක මුදල ක් වැය වේ යැයි අපේක්ෂා කරමු.

**ii .කාර්යය මණ්ඩල**

රාජකාරීමය අවශ්‍යතා වෙනුවෙන් බාහිර යාමට සිදුවන නිලධාරීන් සඳහා ගෙවනු ලබන සංයුක්ත දීමනා හා ගමන් වියදම් මේ යටතේ ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව 2023 වර්ෂයට රු.600,000.00 ක මුදල ක් වැය වේ යැයි අපේක්ෂා කරමු.

**<u>103. (1) කාර්යාල උපකරණ හා ලිපිද්‍රව්‍ය</u>**

කාර්යාලීය පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය වන කාර්යාල උපකරණ හා ලිපිද්‍රව්‍ය සඳහා වන වියදම ලෙස රු..1,500,000. 00ක මුදල ක් වැය වේ යැයි අපේක්ෂා කරමු.

**<u>103.(2)ඉන්ධන හා ලිහිසි තෙල්</u>**

**i. කාර්ය මණ්ඩල නොවන .**

ප්‍රාදේශීය සභා මන්ත්‍රීන් සඳහා 2023 වර්ෂයට 4,500,000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

**ii කාර්ය මණ්ඩල**

ආයතනයේ කටයුතු උදෙසා භාවිතා වන වාහන සඳහා අවශ්‍ය වන ඉන්ධන සඳහා 2023 වර්ෂයට රු.350,000. 00ක් ඇස්තමේන්තු කර ඇත.

**<u>103(3) සංග්‍රහ වියදම්.</u>**

මේ යටතේ මාසික සභා රැස්වීම්, වෙනත් රැස්වීම් හා උත්සව සඳහා අවශ්‍ය වන සංග්‍රහ වියදම් ලෙස 2023 වර්ෂයට රු.400,000. 00ක් ඇස්තමේන්තු කර ඇත.

**104) 1 (වාහන හා යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව හා නඩත්තුව**

මේ යටතේ කාර්යාලයේ පවතින

| | | |
|---|---|---|
| කැබ් රථ | සඳහා | රු.1,000,000.00 |
| ෆොටෝකොපි යන්ත්‍රය | සඳහා | රු. 200,000.00 |
| ත්‍රිවීලර් | සඳහා | රු. 200,000.00 |
| පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර | සඳහා | රු. 250,000.00 |
| සභාවේ අන්තර්ජාල නඩත්තුව | සඳහා | රු. 100,000.00 |

සඳහා 20 23 වර්ෂයට මුදල් වෙන් කර ඇත.

**104(2) ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තුව.**

ප්‍රධාන කාර්යාලයේ ,එල්ලබඩ ,කිරිඇල්ල ,දෙබම්පේ යන කාර්යාල වල නඩත්තුව සඳහා 2023 වර්ෂයට රු.600,000. 00ක් ඇස්තමේන්තු කර ඇත.

**105 (2) සම්බන්ධතා සේවා) දුරකථන.(**

මේ යටතේ සභාපති තුමා,උපසභාපති තුමන් හා මන්ත්‍රීවරුන් 43 ක් සඳහා හා මෙම සභාවේ භාවිතා කරන පහත ස්ථාවර දුරකථන අංක වෙනුවෙන් සභාපතිතුමා 045 – 2263475, ප්‍රධාන කාර්යාලය 045– 2262276, කිරිඇල්ල 045– 2265875 හා එල්ලබඩ 036- 2258175යන අංක සඳහා රු.1,800,000.20 0023 වර්ෂයට ඇස්තමේන්තු කර ඇත.

**105 (3) 1. විදුලිය**

ප්‍රධාන කාර්යාලයේ හා උප කාර්යාල 03හි විදුලි බිල සඳහා 2023 වර්ෂය සඳහා රු. 300,000. 00ක් ඇස්තමේන්තු කර ඇත .

**105(4) බදු මිල හා කුලී**

මේ යටතේ රජයේ ආයතන සඳහා) දුම්රිය දෙපාර්තමේන්තුව හා බෙන්ත් ඇල්ල රක්ෂිතය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් වෙත( එකී භූමි සඳහා බදු ගෙවීමට 2023 වර්ෂය සඳහා රු.200,000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

**105(9) වෙනත් රජයේ දෙපාර්තමේන්තු සඳහා ගෙවීම.**

1.මුද්දර ගාස්තු දිරි දීමනා
2.උසාවි දඩ දිරි දීමනා
3.විගණන ගාස්තු
4.රක්ෂණ හා ආදායම් බලපත්‍ර ගාස්තු
5.කාර්යය සාධන ,ඵලදායිතා, ඝන අපද්‍රව්‍ය කළමනාකරන වැඩසටහන් සඳහා
6.පළාත් පාලන මාසය සඳහා

අප සභාවේ කාර්යයන් වෙනුවෙන් ඉහත දෙපාර්තමේන්තු වෙනුවෙන් 2023 වර්ෂයට මුදල් වෙන්කර ඇත.

**107(2) සුභ සාධන ගෙවීම්**

සුභ සාධන හා කරුණා සහගත කටයුතු වෙනුවෙන් 2023 වර්ෂයට රු.100,000. 00ක මුදලක් වෙන් කර ඇත.

**107(3) සේවක පුහුණු වැඩමුළු**

ප්‍රාදේශීය සභා නිලධාරීන්,සේවකයන් හා මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් දේශීය හා විදේශීය පුහුණු වැඩමුළු පැවැත්වීම හා පුහුණු අවස්ථාවලට යොමු කිරීම සඳහා 2023 වර්ෂයට රු.1,500,000.00 ක මුදලක් වෙන් කර ඇත.

**108(1) විශ්‍රාම වැටුප් හා දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම.**

විශ්‍රාමික පාරිණත සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම හා සභා නිලධාරීන් ලබා ගන්නා නිදහස් දුම්රිය බලපත්‍ර වෙනුවෙන් කරන ගෙවීම් සඳහා 2023 වර්ෂයට රු.125,000.00 ක මුදලක් වෙන් කර ඇත.

**109. ප්‍රාග්ධන වැය**

කාර්යාලයේ ප්‍රාග්ධනිත වියදම් සඳහා 2023 වර්ෂයට රු.3,000,000. 00ක මුදලක් වෙන් කර ඇත.

## 01.පොදු පරිපාලනය - 2023 වියදම් ඇස්තමේන්තුව

| වැය විෂය සංකේතය | 2021 වියදම | 2022 වියදම් ඇස්තමේන්තුව | 2022.06.30 ට වියදම | 2023 වියදම් ඇස්තමේන්තුව | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | උපකාර්යාලය | | | | එකතුව |
| | | | | එල්ලාවල | කිරිඇල්ල | දොඩම්පේ | ප්‍රධාන | |
| 105.ප්‍රවාහන හා සම්බන්ධතා සේවා | | | | | | | | |
| 105.(1).ප්‍රවාහනය | 38,000.00 | 200,000.00 | 12,000.00 | | | | 200,000.00 | 200,000.00 |
| 105(2).සම්බන්ධතා සේවා(දුරකථන) | 1,763,608.59 | 1,730,000.00 | 855,760.00 | | | | 1,800,000.00 | 1,800,000.00 |
| 105(3).ආවශ්‍යක සේවා | | | | | | | | - |
| 1.විදුලිය | 187,051.00 | 300,000.00 | 58,644.55 | | | | 300,000.00 | 300,000.00 |
| 11.ජලය | 16,046.43 | 15,000.00 | 5,566.50 | | | | 15,000.00 | 15,000.00 |
| 105(4).බදුමිල හා කුලී | 3,000.00 | 200,000.00 | | | | | 200,000.00 | 200,000.00 |
| 105(9).වෙනත්-රජයේ දෙප.සඳහා ගෙවීම් | | | | | | | | |
| 1.මුද්දර ගාස්තු | | 200,000.00 | | | | | 200,000.00 | 200,000.00 |
| 11.උසාවි දඩ දිරි දීමනා | | 200,000.00 | | | | | 200,000.00 | 200,000.00 |
| 111.විගණන ගාස්තු | | 225,000.00 | | | | | 250,000.00 | 250,000.00 |
| IV.රක්ෂණ හා ආදායම් බලපත්‍ර ගාස්තු | 618,217.18 | 800,000.00 | 61,983.88 | | | | 600,000.00 | 600,000.00 |
| V.කාර්ය සධන,ඵලදායිතා,ඝන අපද්‍රව්‍ය,කළ.වැඩසටහනන් හා පළාත් පාලන මාසය සඳහා | | 200,000.00 | 142,945.00 | | | | 200,000.00 | 200,000.00 |
| V11.භාෂා දීමනා | | 10,000.00 | | | | | 10,000.00 | 10,000.00 |
| 105(10).ආදායමින් ආපසු ගැනීම් | | 20,000.00 | 1,998.00 | | | | 20,000.00 | 20,000.00 |
